# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2144/64 - 2019 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා - 2019.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 6/2017

**2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත**

6 වන වගන්තිය යටතේ වූ නියමය

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය අර්ජුන රණතුංග වන මා විසින්, මෙම නියමය මගින්, ඉහත කී පනතේ 6 වන වගන්තිය යටතේ සාදන ලදුව, 2015 ජුලි මස 07 වන දින හා අංක 1922/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, එහි ''හම්බන්තොට, මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී'' යන වචන වෙනුවට, ''හම්බන්තොට, මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී, රත්මලාන, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී, යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී සහ මඩකලපුව ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී,'' යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

අර්ජුන රණතුංග,
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

10 - 1002

1A - G 31241 — 42 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*